25



# අජ්නබී - මහ්රමී සීමාවන් අනුගමනය කරමු



මිනිසාට හුදෙකලාවේ ජීවත්වීම අපහසු ය. සමූහ ජීවිතයට මිනිසා වඩාත් නැඹුරු ය. හුදෙකලාවේ ජීවත් වන විට ඉස්ලාම් පවරා ඇති අනිවාර්ය ක්‍රියාවන් කිසිවක් ඔහුට කළ නොහැක. සමාජයේ වගකීමක් වන ෆර්ලු කිෆායා තනි ව අනුගමනය කිරීම අපහසු ය. එම නිසා අනිවාර්යයෙන් ම සමාජය සමග ජීවත් වීම සහ ඥාති සබඳතා වර්ධනය කිරීම අවශ්‍ය වේ. මෙසේ සමාජය සමග ජීවත් වීමේ දී හා සමාජ සබඳතා ශක්තිමත් කිරීමේ දී අනුගමනය කළ යුතු සීමාව නිර්ණය කිරීමට අජ්නබී මහ්රමී නීති රීති අවශ්‍ය වේ.

ප්‍රථමයෙන් මහ්රම් යන වචනය අවධානය යොමු කරමු. මෙම වචනය ව්‍යවහාරයේ දී "හරාම්" යන තේරුම ගෙන දෙයි. පවුලේ නෑකම හේතුවෙන් හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ ස්ත්‍රියකට විවාහ කර ගැනීමට තහනම් වූ පිරිමියා පිළිබඳ ව හා පිරිමියා විවාහ කරගැනීම ට තහනම් වු ස්ත්‍රීය හැඳින්වීමට මෙම වචනය භාවිත කෙරේ. පහත සඳහන් ලේඛනය පිරිමින්හට විවාහ කිරීමට නුසුදුසු ස්ත්‍රීන් වෙති. මේ සඳහා (මහ්රමී) යන වචනය භාවිතා වේ. මේ අයගේ විරුද්ධ පාර්ශවය ස්ත්‍රීන් හට මහ්රමී වෙයි.

පහත සඳහන් "මහ්රම්" යන ලේඛනයේ ඇතුළත් නොවූ අය "අජ්නබි" යන ගණයට අයත් වෙයි. අජ්නබි යන වචනය දුර නෑකම, නවකයා, නෑකමක් නැති කෙනා, සම්බන්ධයක් නොමැති කෙනා වැනි විවිධ තේරුම් දරයි.

## පවුල් නෑකම

- ★ මව, මවගේ මව.
- ★ දුව, දුවගේ දූවරුන්, පුතාගේ දූවරුන්.
- ★ සහෝදරිය, පිය පාර්ශවයේ සහෝදරිය, මවු පාර්ශවයේ සහෝදරිය.
- ★ පියාගේ සහෝදරිය.
- ★ මවගේ සහෝදරිය.
- ★ සහෝදරයාගේ දුව, මවු පාර්ශවයේ සහෝදරයගේ දුව, පිය පාර්ශවයේ දුව.
- ★ සහෝදරයාගේ දුව, මවු පාර්ශවයේ සහෝදරයාගේ දුව, පිය පාර්ශවයේ සහෝදරයාගේ දුව.

### කිරි නෑකම

- ★ කිරි පෙවූ මව, ඇයගේ මවුවරුන්, පියාගේ මව.
- ★ කිරි නෑකමේ දුව, දුවගේ දුව, පුතාගේ දුව.
- ★ කිරිනෑකමේ සහෝදරිය, මවු පාර්ශවයේ සහෝදරිය, පිය පාර්ශවයේ සහෝදරිය.
- ★ කිරි පෙවූ මවගේ සහෝදරිය.
- ★ කිරි නෑකමේ පියාගේ සහෝදරිය.
- ★ කිරි නෑකමේ සහෝදරයාගේ දුව.
- ★ කිරි නෑකමේ සහෝදරියගේ දුව.

### විවාහක නෑකම්

- ★ භාර්යාවගේ මව
- ★ භාර්යාවගේ දුව
- ★ පුතාගේ භාර්යාව
- ★ පියාගේ භාර්යාව

දැන් අප විවාහ වීමට අනුමත කළ අජ්නබි වූ අය පිරිමි සමග ආශ්‍රය කිරීමේ දී අනුගමනය කළ යුතු කරුණු පිළිබඳ අවධානය යොමු කරමු.

**01. පහත බැලීම :- (බැල්ම පාලනය කර ගැනීම)**

ශරීරයේ අව්රතයට අයත් කොටස් දෙස බැලීම හෝ කාමාශාවෙන් බැලීම හේතුවක් හෝ අවශ්‍යතාවක් හෝ නොමැති ව නොකඩවා බැලීම යන ඒවායින් වැළකී සිටීම. **තිදෙනකුගේ ඇස් අපාය නොදකී.** එනම් ;

- ■ අල්ලාහ්ගේ යහ මගට නිදි මැරූ ඇස්.
- ■ අල්ලාහ්ගේ බිය බැතියෙන් හැඬූ ඇස්.
- ■ අල්ලාහ් විසින් තහනම් කළ දෙය නොබැලූ ඇස්.

02. කාන්තාව අවිරතය සම්පූර්ණයෙන් ම වැසෙන පරිදි හා ගරුත්වය රැකෙන පරිදි ඇඳුම් ඇඳීම.

03. ඇවිදීම, ඇඳුම් ඇඳීම, හැසිරීම හා කථා කිරීම වැනි සියලු කරුණු ඉස්ලාමීය චාරිත්‍රයට අනුව පිළිපැදීම.

04. පිරිමින්ගේ හැඟීම් ඇවිස්සෙන ක්‍රියාවල නොයෙදීම :සුවඳ විලවුන් ආලේපනය, ඉමහත් ලෙස අලංකාර වූ ඇඳුම් ඇඳීම වැනි ක්‍රියා නිවසට පමණක් සීමා කිරීම. මාර්ගයේ ගමන් කරන විට සමාජය පරිහානියට පත් වන අන්දමට හැසිරීමෙන් වැළකී සිටිය යුතු ය.

05. අජ්නබි වූ ස්ත්‍රී පුරුෂ යුගලය හුදෙකලා වීමට ඇති අවස්ථා සීමා කළ යුතු යි. ඔබගෙන් (පිරිමි) කෙනෙක් වෙනත් කාන්තාවක් සමග හුදකලාවේ සිටි විට එම දෙදෙනා සමග තුන්වැන්නා වශයෙන් ෂෛතාන් සිටින්නේ ය. (බස්සාර්)

06. සමාජ යහපත සහ අවශ්‍යතා වෙනුවෙන් පමණක් ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවය ම හමු වන අවස්ථා සංවිධානය කළ යුතු වේ. ස්ත්‍රිය ඇගේ දුරස් කරන, ඇය අපකීර්තියට පත් කරන, ඇගේ මූලික කර්තව්‍යවලින් ඇය ඈත් කරන ආකාරයේ ක්‍රියා (ඇගේ ස්වාභාවික ස්වරූපයෙන්) ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවය පමණක් නොව මුළු මහත් සමාජය ම විනාශය කරා යොමු කරවයි.

අපේ යහපත සඳහා ඉස්ලාම් අපට පනවා ඇති සීමාවන් අනුගමනය කර ඥාතිත්වය පණ ගැන්විය යුතු ය. එම නිසා මනා සබැඳියාවක් ඇති විය හැකි ය.

**අභ්‍යාස**

01. ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවය සාකච්ඡා කිරීමේ දී අනුගමනය කළ යුතු නීති රීති මොනවා ද? මෙය අනුගමනය නොකිරීමෙන් සමාජයට වන හානිය සඳහන් කරන්න.

02. සීමා රහිත ස්ත්‍රී - පුරුෂ සම්බන්ධතා නිසා සිදු වූ හානි තුනක් පිළිබඳ පුවත්පත් වල පල වූ පුවත් පදනම් කර ගනිමින් විස්තර කරන්න.

03. මහ්රමී අජ්නබී යන සංකල්ප දෙක අතර ඇති වෙනස්කම් පැහැදිලි කරන්න.